# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2018 ජනවාරි මස 05 වන දින

## II වන කොටස

## අතිරේකය

(2018.01.08 දින නිකුත් කරන ලදී)

# නිමල් රූපසිංහ මිත්‍රත්ව පදනම (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි.)

**නිමල් රූපසිංහ මිත්‍රත්ව පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉෂාක් රහුමාන් මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 18.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# නිමල් රූපසිංහ මිත්‍රත්ව පදනම (සංස්ථාගත කිරීමේ)

## නිමල් රූපසිංහ මිත්‍රත්ව පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"නිමල් රූපසිංහ මිත්‍රත්ව පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ පදනමේ, පරමාර්ථ හා ඊට අදළ කාරණා ඵලදයී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්ය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, එකී පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පරමාර්ථ සහ කරුණු එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2018 අංක  දරන නිමල් රූපසිංහ මිත්‍රත්ව පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

නිමල් රූපසිංහ මිත්‍රත්ව පදනම සංස්ථාගත කිරීම.

**2.** (1) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) නිමල් රූපසිංහ මිත්‍රත්ව පදනමේ දනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන) නිමල් රූපසිංහ මිත්‍රත්ව පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේ, එය පාවිච්චි කිරීමේ, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ

(අ) ශ්‍රී ලංකාව තුළ ජීවත්වන සියළුම ජාතීන් අතර, සමගිය හා සහජීවනය ඇතිකොට ශ්‍රී ලාංකිකයන් ලෙස ජීවත්වීමට අවශ්‍ය පරිසරය සැකසීම සඳහා අවශ්‍ය මගපෙන්වීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

2- PL 010474 -300 (2017/11)

(ආ) "නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් නොවේ" යන තේමා පාඨය මුල්කොටගෙන කිසිදු භේදයකින් තොරව ලාංකීය ජන සමාජය නීතියෙන් දැනුවත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය දැනුම ලබාදීම හා ඒ සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඇ) "සිසු සහන මව්පිය කැපකරු ශිෂ්‍ය ආධාර වැඩසටහන" ක්‍රියාත්මක කිරීම තුළින් දූයේ දරුවන්ගේ අධ්‍යාපන දැනුම වර්ධනය කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපන උපකරණ හා පහසුකම් සැලසීම;

(ඈ) අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පොත් පත්, සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම, බෙදාහැරීම සිදු කිරීම;

(ඉ) පෙර පාසල් දරුවන්ගේ අධ්‍යාපනය ප්‍රවර්ධනයට අවශ්‍ය දැනුම ලබාදීම සහ අධ්‍යාප පහසුකම් සැලසීම;

(ඊ) අධ්‍යාපනය ලබන දරුවන්ගේ දැනුම වර්ධනය කරගැනීමට අවශ්‍ය පුස්තකාල ප්‍රවර්ධනය හා ඒවාට අවශ්‍ය පොත් පත් ලබා දීම;

(උ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සා/පෙළ, උ/පෙළ ශිෂ්‍යයන්ගේ දැනුම වර්ධනයට අවශ්‍ය සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම;

(ඌ) විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා ආධාර සැපයීම;

(එ) ඉහත දක්වා ඇති සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා දේශනා, සම්මන්ත්‍රණ, සාකච්ඡා, ප්‍රදර්ශන, සැණකෙළි ඇතුළු විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ; සහ

(ඒ) ඉහත දක්වා ඇති සංස්ථාවේ පරමාර්ථයන්ට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංවිධාන සමග එකතුවී එකී පරමාර්ථ ඉටුකරවා ගැනීමට කටයුතු කිරීම.

**සංස්ථාවේ බලතල.**

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ප්‍රදානයන්, පරිත්‍යාග බාරගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නිරත කිරීම, සේවයේ නියුක්ත කිරීම හා සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථක් හෝ ඉටුකර ගැනීම සඳහා සහ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියළු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටුකිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

**5.** (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ අනෙකුත් විධිවිධානවලට යටත් ව සහ සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනනුකූලව තෝරාපත් කරගනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු එකොළොස් දෙනෙකුගෙන් සමන්විත විධායක කමිටුව මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරූ පදනමේ විධායක කමිටුව සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව විය යුතු ය.

**සංස්ථාවේ රීති.**

**6.** (1) සංස්ථාව විසින් සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන්නා වූ රීති, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල විය යුතු ය:-

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, අස්කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු ;

(ආ) සංස්ථාවේ හා විධායක සභාවේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එකී රැස්වීම්වල ගණපූරණය ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත්කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය හා කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ සහ විධායක සභාවේ සාමාජිකයකු වීම සඳහා අවශ්‍ය කරන සුදුසුකම් ; සහ

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් කිසි රීතියක් මේ වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් ම එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**සංස්ථාව විසින් සහ සංස්ථාවට ගෙවිය යුතු මුදල්.**

**7.** මෙම පනත ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ පැවති පදනමේ සියළු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, දයක මුදල් සහ සාමාජික මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.**

**8.** යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු බැහැර කිරීමකින් හෝ වෙනත් ආකාරයකින් පදනම වෙත සතු කරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එකී සියලු දේපළ පදනම විසින් මේ පනතේ කාර්ය සඳහා දැරිය යුතු ය. තව ද, පදනමේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය පදනම සතු වන්නේ ය.

**සංස්ථාවේ අරමුදල.**

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග හෝ රික්තවරණ, පරිත්‍යාග, පැවරුම්, ග්‍රාහක මුදල්, දයක මුදල්, හෝ ගාස්තු වශයෙන් සංස්ථාව වෙත හෝ සංස්ථාව වෙනුවෙන් ලැබෙන මුදල්, සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියළු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

සංස්ථාවේ මුද්‍රාව.

**10.** සංස්ථාවේ සභාපතිවරයා සහ ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් විසින් තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි ම තම නම් අත්සන් කරනු ලැබිය යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරන අත්සනට පරිබාහිරව විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

**11.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයට පත්කිරීමේ කාර්ය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔවුන්ගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**12.** සංස්ථාව විසුරුවා හැරීමේදී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයකට පත්කිරීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, එම දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද වෙනත් ආයතනයකට එම දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර සංස්ථාවේ සභාව විසින් තීරණය කළ යුතු ය.

විගණනය හා ගිණුම්.

**13.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලුම ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැළැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, සභාව තීරණය කරන පරිදි සුදුසුකම්ලත් විගණකවරයකු විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) ගණකාධිකාරි ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරි ආයතනයක්,

අදහස් වේ.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් සහ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.